**ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය - 2019**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 අභිතකර මතය**

---

ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 අභිතකර මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක්ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 01 වගන්ති අංක 132 ප්‍රකාරව සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් ඉදිරිපත් කල යුතු වුවද අධිකාරියේ රු.199,793,706 ක විකුණුම් ආදායම් හඳුනාගන්නා ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | ලද හා ලැබිය යුතු ආදායම් සලකා බැලීමේ සාධාරණ වටිනාකම මත ආදායම මනිනු ලැබේ. 2020 වර්ෂයේ ගිණුම් තුලින් මෙම ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට කටයුතු කෙරේ. 2019 මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් ප්‍රතිපත්ති අංක 2.2 දක්වා ඇති ආකාරයට අධිකාරිය විසින් උපචිත පදනම මත ගිණුම් සකසන අතර ඒ අනුව මුදලට විකිණීම් හා ණයට විකිණීම් හඳුනාගනු ලබයි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 වගන්තිය පරිදි දේපළ, පිරියත හා උපකරණ වල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට, වසර 03 කට හෝ වසර 05 | වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා අප අධිකාරියට එම කර්තව්‍ය පැවරිය හැක්කේ තක්සේරු දෙපාර්තමේන්තුවටය. එම දෙපාර්තමේන්තුවට මින් පෙර සිදුකල ප්‍රත්‍යාගණන සම්බන්ධවද නිසි අයුරින් එම දෙපාර්තමේන්තුව කටයුතු නොකරන ලදි. අධිකාරියේ ඇති වත්කම් ප්‍රමාණය අනුව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වත්කම් වල සාධාරණ අගය දැක්වෙන පරිදි වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කට වරක් ප්‍රත්‍යාගණනය සිදුකිරීම කළ යුතු වුවද, අධිකාරියේ ආරම්භක වර්ෂය වන 1998 වර්ෂයෙන් පසුව සියළුම වත්කම් වෙනුවෙන් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර නොතිබුණි. | මෙම කාර්යය ඉතා සංකීර්ණ වන අතර නමුදු මේ සම්බන්ධව කටයුතු කිරිම පිළිබඳව සලකා බලනු ලැබේ. | |
| (ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීම් රු. 1,751,100 ක් සහ වත්කම් අත්පත් කර ගැනීම සඳහා ඉකුත් වර්ෂය තුලදී වැයකර තිබුණු රු. 507,649,300 ක් පිලිවෙලින් මෙහෙයුම් සහ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබීමත්, ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැයකර තිබුණු රු.222,871,670 ක් මුදල් ගලා ඒමක් ලෙස වැරදි සහගත ලෙස ආයෝජන කටයුතු යටතේ පෙන්වා තිබීමත් සහ අධිකාරියට ලැබී තිබූ රු. 82,498,182 ක ප්‍රදාන මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ පෙන්වා නොතිබීමත් සහ අමාත්‍යාංශයෙන් මසුන් නිකුත් කිරීම සඳහා ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.21,661,135 ක් දෙවරක් විකුණුම් හා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ නිවැරදි නොවන ලෙස දක්වා තිබීමත් හේතුවෙන් මුදල් ප්රවාහ ප්‍රකාශයේ නිවැරදිතාවය විගණනයේදී පිලිගත නොහැකි විය. | ඉදිරියේ දී මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරිමේ දී මේ පිළබඳව අවදානය යොමු කිරිමට කටයුතු කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 08 හි 97ඡේදය ප්‍රකාරව අධිකාරියට එරෙහිව වන්දි ඉල්ලා නඩු 03 ක් සහ බේරුම් කරන නඩු 03ක් ලෙස නඩු 06 ක් ගොනුකර තිබුණද එකී නඩු වලින් ඇතිවිය හැකි බැදීම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 324 කදී බැංකුවකට සෘජුව බැර කර තිබුණු රු.3,766,745 ක් වූ බැංකු තැන්පත් හඳුනාගෙන ගිණුම් වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | සෘජු බැංකු තැන්පතු හඳුනාගැනීම තරමක් සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර පසුගිය කාලය පුරාවට අධිකාරිය මෙම සෘජුලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමේ විශාල ප්‍රගතියක් ලබාගෙන ඇත. 2019 දෙසැම්බර් 31 දින වන විට සියලු සෘජු ලැබීම් හඳුනා ගිණුම්ගත කර ඇති අතර මේ වසරේ ජනවාරි සිට මේ දක්වා සෘජුලැබීම් කිහිපයක් හැර අනෙකුත් ලැබීම් මසක කාලයක් ඉක්ම නොයන පරිදි හඳුනාගෙන ගිණුම්ගත කර ඇත. මෙම ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීමට **Google Spread Sheet** යොදා ගැනීමට සැලසුම්කර ඇත. | සෘජු බැංකු තැන්පත් හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර එය ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) ජීව විද්‍යාත්මක වත්කම් ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඒ අනුව අධිකාරිය විසින් මත්ස්‍ය පැටව් බෝ කිරීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන මව් මත්ස්‍ය තොගයෙහි වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ජීව විද්‍යාත්මක තොග අගයකර ඇත්තේ එහි විකුණුම් වටිනාකමට පදනම් කර ගෙනය. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 41 ට අනුකූල වන පරිදි සුදුසු මත්ස්‍ය තොග අගය කිරීමේ ගිණුම් ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ධීවර හා ජලජ වගා ප්‍රතිලාභීන්ට යටිතල පහසුකම් සැපයීම සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ දරා තිබුණු රු. 211,351,045 ක් සංවර්ධන ව්‍යාපෘති වියදම්, සංවර්ධන ව්‍යාපෘති යටතේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරනු වෙනුවට වෙනත් ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | රු.183,691,999 වටිනා **Crab city** ව්‍යාපෘතියට අදාල ඉදිකිරීම් සඳහා යොදාගන්නා ලද ඉඩම අදාල අයිතිකරුවන් විසින් අප අධිකාරියට තාවකාලිකව පවරා දී ඇති අතර අධිකාරිය විසින් අවශය පරිදි ඔවුන්ට සුදුසු ස්ථානයන් නැවත ඔවුන් වෙත පවරා දීමක් සිදු කරනු ලබයි. එබැවින් මෙම ඉදිකිරීම් වටිනාකම අපගේ මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කරන ලද අතර එය ජංගම වගකීම් යටතේ පෙන්නුම් කරන ලද්දේ අදාල පුද්ගලයන් වෙත පවරා දිය යුතු බැවිනි. සුන්දර තොටුපල ව්‍යාපෘතියේ දී එම ඉඩම් අයිතිය අප සතු නොවුව ද ඉදිකිරීම් අවසන් වූ පසු කොන්ත්‍රාත්නරුගෙන් ඉදිකිරීම පවරා | සංවර්ධන කටයුතු කිරීමට පෙර ඉඩම් වල හිමිකාරීත්වය පවරාගැනීමට කටයුතු කළ යුතුයි. භාණ්ඩාගාරයේ මුදල් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට පෙර සැලසුම් සකස් කර පාරිසරික හා සක්‍රියතා වාර්තා ලබාගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | ගනු ලැබුවේ අධිකාරිය විසින් වන බැවින් මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කරන ලද අතර එය ජංගම වගකීම් යටතේ පෙන්නුම් කරන ලද්දේ අදාල පුද්ගලයන් වෙත පවරා දිය යුතු බැවිනි. | |
| (ඇ) | අධිකාරියට අයත් වන අධිකාරියේ කටයුතු සඳහා දැනට භාවිතා කරන ඉඩම් කැබලි 18 ක වටිනාකම තක්සේරු කර 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. මෙම නිසා අධිකාරියේ ඉඩම් වල අගය මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වුණි. | අධිකාරියට අයත් සියළු ඉඩම් 2020 මූල්‍ය ප්‍රකාශන වාර්තා වලට ඇතුලත් කිරීමට හැකිවන පරිදි 2020 දෙසැම්බර් 31 දිනට ඉඩම් වලට පමණක් අදාල වන පරිදි තක්සේරු කර ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් සිටින අතර මේ වන විට කහඳමෝදර සහ අඟුණවැව මධ්‍යස්ථාන තක්සේරු කිරීම සඳහා යොමු කර ඇත. | අධිකාරියට අයත් ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුලදී මත්ස්‍ය වගාකරුවන් සඳහා නොමිලේ බෙදා දී තිබුණු රු. මිලියන 58 ක් වූ ඉස්සන් පසු කීටයන් වෙනත් වියදම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට විකුණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ දල ලාභය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | නොමිලයේ නිකුත් කිරීම් පිරිවැය ගණනය කර තොගයෙන් අඩුකර පිරිවැය වියදම් ලෙස දැක්විය යුතුය. |
| (ඊ) | කොන්ත්‍රාත් රෙජිස්ටරය තුල ඇතුලත් 2019 වර්ෂයේ කෙරීගෙන යන කොන්ත්‍රාත් වැඩ සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු. 94 ,821, 266 ක වගකීම් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ජංගම වගකීම් ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | අධිකාරිය විසින් ඉදිකිරීම් සම්බන්ධව ගෙවීමට ඇති බිල්පත් ගිණුම් තුලින් හඳුනා නොගනු ලබන්නේ ඉදිරි වර්ෂයේ දී ගිණුම්ගත කිරීමේ දී ඇතිවන ද්විත්ව සටහන් ගැටලුව පදනම් කරගෙන වේ. එනම් අප විසින් ගෙවීම් කිරීමේ දි අදාල වැය විෂයට වියදමක් සේ හඳුනා ගනු ලැබේ. ගෙවිය යුතු ලෙස ගිණුම් සටහන් කිරීමේ දී ද අදාල වැය විෂයට වියදමක් සේ හඳුනා ගැනීමට සිදු වේ. එවිට ඉදිරි වර්ෂයේ දී මෙම ගෙවීම් සිදුකිරීමේ දී නැවත වරක් අදාල වර්ෂයේ වැය විෂයකට වියදමක් සේ හඳුනා ගැනීමට සිදු වේ. එවිට එකම වටිනාකම වර්ෂ 02 ක දී වැය විෂයන්ට හඳුනා ගැනීමට සිදු වේ. නමුත් භෞතික ප්‍රගතිය සඳහා මෙම නොගෙවූ බිල්පත් ද ඇතුලුව වර්තා කරනු ලැබේ. මේ සම්බන්ධ අධිකාරියේ ගිණුම් කටයුතු පිළිබඳව | මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තබන නිසා ගෙවිය යුතු බිල්පත් උපචිත වියදම ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | තව දුරටත් අධ්‍යානය කිරිමට කටයුතු කරනු ලැබේ. | |
| (උ) 1998 වර්ෂයේදී අධිකාරිය ස්ථාපිත කිරීමේදී පවරන ලද උඩවලව පිහිටි ගොඩනැගිලි ඇතුළු ඉඩම් දෙකක තක්සේරු කල වටිනාකම හෝ පවරන ලද අගය වූ රු.89,630,000 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. එසේම 2007 වර්ෂයේදී භුක්තිය පවරා තිබූ මොණරාගල ජලජීවී වගා ව්‍යාපෘති කාර්යාලය පිහිටි ඉඩමෙහි වටිනාකම 2012 වර්ෂයේදී රු.9,700,000 කට තක්සේරු කර තිබූ නමුත් එකී ඉඩම සහ එහි ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | අධිකාරියේ වත්කම් නිවැරදිව හඳුනාගෙන නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ණයගැති ශේෂ | 30,003,330 | ශේෂ සනාථන | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ශේෂ සනාථන ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) දිවිනැගුම අරමුදල යටතේ ණය ලබා දීම. | 59,047,009 | ගිවිසුම් | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ගිවිසුම් සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) දිවිනැගුම ණය ලැබීම් | 3,707,500 | විස්තරාත්මක උපලේඛන | | |
| (ඈ) මත්ස්‍ය ඇඟිල්ලන් | 1,258,960 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති අයිතම තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කළ යුතු වේ. |
| (ඉ) ණයහිමි ශේෂ 13 ක් | 3,884,459 | | | |
| (ඊ) විවිධ තැන්පත් | 5,221,615 | | | |
| (උ) හඳුනා නොගත් ශේෂ | 452,474 | | | |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |
| **i)** මුදල් රෙගුලාසි 371 (ඇ) | අත්තිකාරම් දෙන ලද කාර්යය නිමකල විගස පියවිය යුතු වුවත් අවස්ථා 28 කදී රු.437,000 ක් වූ අත්තිකාරම් එසේ පියවීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රමාද කාලය දින 14 සිට දින 326 ක පරාසයක් විය. | **2019** දෙසැම්බර් **31** දින වන විට නොපියවූ අත්තිකාරම් ශේෂයෙන් 2020 ජූලි 14 වන විට පියවීමට ඉතිරිව ඇත්තේ රු. 96,640.03 ශේෂයක් පමණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |
| **ii)** මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කල යුතු වුවද, එක් ජංගම ගිණුමකට අදාලව අගෝස්තු සිට දෙසැම්බර් මාසය දක්වා බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | බැංකු සැසඳුම් පිළියෙල කිරීම පොත් තබන්නා විසින් සිදුකල යුතුව ඇති අතර , පොත් තබන්නාගේ තනතුර හදිසියේ පුරප්පාඩු වීමත් සමගම අගෝස්තු සිට දෙසැම්බර් දක්වාම එම කටයුතු සිදුකිරීමට නොහැකි විය. | මුදල් රෙගුලාසි අනුව බැංකු සැසඳුම් සකස් කළ යුතු අතර බැංකු සැසඳුම් සකස් කිරීම මඟින් නිසි මූල්‍ය පාලනයක් ඇති කළ යුතු වේ. |
| **iii)** මුදල් රෙගුලාසි 570 | අධිකාරියේ නිරවුල් නොවූ වසර 05 සහ වසර 10 ඉක්මවූ කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු.3,917,966 සහ රු.8,088,637 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රඳවාගෙන ඇති මුදල් සම්බන්ධව ඉංජිනේරු අංශයේ ලේඛන සමඟ පරික්ෂා කර ශේෂ නිරවුල් කිරිමට හෝ මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **II** වැනි කාණ්ඩයේ **XLVIII** වැනි පරිච්ඡේදයේ 29 වගන්තිය | කහදමෝදර මීරිදිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීමේදී වැඩිපුර ගෙවූ රු.947,068 ක මුදල සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් පියවර ගෙන නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **4:2:1** උපවගන්තිය | ප්‍රසම්පාදන සැලැස්මෙහි අයිතම 27 ක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 243.95 ක් ප්‍රතිපාදනය කර තිබුණද මේ සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය අධිකාරිය ලබාගෙන නොතිබූ අතර විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරද නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **4:2:1** ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්ම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනිම**,** එයට අදාල අයවැය සහ ක්‍රියාකාරි සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගන්නා අවස්ථාවේ සිදු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව හා ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරි සැලසුම් එක් වාර්තාවක් ලෙස සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අත්සන සහිතව 2020 ජනවාරි 31 දිනට පෙර ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතුවේ. |
| (ඈ) අංක 02/2017 හා 2017 දෙසැම්බර් 21 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය මඟින් අධිකාරියට ලබා දී ඇති ට්‍රැක්ටර් 3 ක් සහ බයිසිකල් 5 ක් ලියාපදිංචි අයිතිය අධිකාරියට පවරාගෙන නොතිබුණි. | ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය ඇතිව පවරාගැනීම සඳහා අධිකාරිය විසින් යතුරු පැදි සහ අත්ට්‍රැක්ටර් රථ පවරාගැනීම සඳහා 2019 මාර්තු 11 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් ධීවර අමාත්‍යාංශයෙන් කර ඇත. එම පවරාගැනීමේ කටයුතු එම ආයතනය සමඟ සම්බන්ධීකරණය වී පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) අංක 01/2018 හා 2018 මාර්තු 19 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | ධාවනය කල නොහැකි තත්වයේ පවතින සියළුම වාහන 2018 ජුනි 30 දිනට පෙර අපහරණය කල යුතු වුවද අධිකාරියේ ධාවන තත්වයේ නොපවතින සංචිත වාහන 4 ක් අපහරණය කිරීම සඳහා | අදාල යතුරු පැදි අප අධිකාරියේ ව්‍යාප්ති කාර්යාල වල නවතා ඇති අතර එම යතුරු පැදි නැවත සුළු අළුත්වැඩියා කටයුතු සිදුකිරීමෙන් පසු නැවත ව්‍යාප්ති නිලධාරීන්ට ලබාදීමට කටයුතු සිදුකරන | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අතර ඉදිරියේදී නව යතුරු පැදි අධිකාරිය විසින් මිලදීගැනීමෙන් පසු එම යතුරු පැදිද අපහරණය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඊ) අංක පීඊඩී 1/2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 උපවගන්තිය | අනුමැතියකින් තොරව ඉන්ධන සීමාව ඉක්මවා 2019 වර්ෂයේදී වියදම් වූ රු.276,511 ක් වූ ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කර තිබුණි. | ඉදිරියේදී මෙම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන අතර, අධිකාරියේ සභාපතිවරයාගේ අනුමත මාසික ඉන්ධන සීමාව වන ලීටර 150 ඉක්මවා රුපියල් විසිපන්දහස (රු.25,000) දක්වා වියදම් ප්‍රතිපූර්ණය සඳහා එම බිල්පත් අනුමත කිරීමේ ලේකම්වරයාගේ බලතල අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට පවරා ගැනීමට ඉදිරියේදී අවශ්‍ය පියවර ගනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (උ) අංක **DMA/01/2019** හා 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛය | 2019 අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ සිදුකර නොතිබූ අතර අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරද නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 55.4 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 10.00 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 45.4 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් පිරිවැය රු. මිලියන 9.68 කින් වැඩි වීම සහ පරිපාලන හා බෙදාහැරීමේ වියදම් පිලිවෙලින් රු. මිලියන 75.5 කින් හා රු.මිලියන 44.8 බැගින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උඩවලව තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ මත්ස්‍ය පොකුණු වල ආරක්ෂාව වෙනුවෙන් ඉඩම වටා පිහිටි වැට පිළිසකර කිරීම සඳහා අතිරේක වැඩ සමඟ රු.4,521,452 ක් වැයකර තිබුණි. අතිරේක වැඩ සඳහා රු.1,647,889 ක් වැය කිරීම හේතුවෙන් මීටර් 550 ක් දිගින් යුතුව සකස් කිරීමට ඇස්තමේන්තු කර තිබූ වැට අදාල ප්‍රතිපාදන සීමාව තුල මීටර් 343.45 ක් පමණක් ඉදිකර තිබුණි. මත්ස්‍ය පොකුණු ආවරණය වන පරිදි වැට ඉදි නොකිරීමත් ඉදිකර තිබුණු වැටෙහි ඇතැම් ස්ථාන වල හිදැස් පිහිටීමත් නිසා මත්ස්‍ය පොකුණු වල ආරක්ෂාව සැලසී නොතිබුණු අතර රු.4,521,452 ක් වැයකර තිබූ කර්මාන්තයේ අරමුණ ඉටුවී නොතිබුණි. | උඩවලව තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ මත්ස්‍ය පොකුණු වල ආරක්ෂාව වෙනුවෙන් භූමිය වටා වැට ඉදිකිරීමට අදාල ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව පිලියෙල කොට ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් කොන්ත්‍රාත්කරු තෝරාගත් පසු යාබද ඉඩමේ හිමිකරු විසින් යෝජිත වැටට සමාන්තරව වැට ආසන්නයෙන් ඇල මාර්ගයක් ඉදිකරන ලදි. මේ හේතුවෙන් වැටෙහි ආරක්ෂාව සඳහා අතිරේක වැඩක් වශයෙන් රැදවුම් බැම්මක් ඉදිකර වැටෙහි ඉදිකිරීම් කටයුතු කිරීමට සිදු වූ බව දන්වනු කැමැත්තෙමි. ඒ අනුව අදාල ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් පරිදි මීටර් 550ක් දක්වා වැට සකස් කිරීමට ප්‍රතිපාදන නොතිබුණි.මේ හේතුවෙන් අදාල ප්‍රතිපාදන සීමාව තුල මීටර 345.45 පමණක් ඉදි කරනු ලැබිණි.තවද වැටෙහි ඇතැම් ස්ථාන වල හැඩැස් පැවතීමට හේතු වූයේ යාබද නිවසේ හිමිකරු විසින් තනන ලද ඇළ මාර්ගයට පසු කාලීනව අධිකාරියේ භූමිය තුල වූ පොකුණු තුලින් ඉවත් කරන ජලය අපවහන මාර්ගයක් හරහා සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වූ බැවිනි ඒ අනුව එහි ඉදිකිරීම් කටයුතු කිරීමට පහසු වන සේ වැටෙහි ස්ථාන කිහිපයකින් හීඩැස් තබා ඇත. | ඉදිකිරීම් කොන්ත්‍රාත් නිසි පරිදි සැලසුම් කර සිදුකළ යුතු අතර ඉදිකිරීම් වලින් සැලසුම් කරන ලද අරමුණු ඉටුකර ගැනීමටද කටයුතු කළ යුතු වේ. |
| (ආ) උඩවලව තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ පොකුණු 04 සහ ගඩොල් ටැංකි 4 ක් ඉදිකිරීම සඳහා රු.17,066,264 ක් වැයකර තිබූ අතර 2019 ජුනි 18 දින විගණනය විසින් භෞතිකව පරීක්ෂා කිරීමේදී එම ඉදිකරන ලද පොකුණු 04 න් 03 කද | B12, B13, B14, B15 මත්ස්‍ය ඇඟිල්ලන් දක්වා වර්ධනය කරනු ලබන පොකුණ වන අතර පරීක්ෂා කරන කාලය තුලදී මත්ස්‍ය ඇසිත්තන් සඳහා වැඩි ඉල්ලුමක් පැවතියෙන් වැඩිපුරම ඇසිත්තන් වශයෙන් නිකුත් කිරීම් සිදු විය. | ඉදිකරන ලද පොකුණු උපරිම ධාරිතාවෙන් උපයෝජනය ගැනීමට පියවර ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

සිමෙන්ති ටැංකි 4 න් 2 කද මසුන් නොමැති විය. මේ අනුව පොකුණු මත්ස්‍ය නිෂ්පාදනය සඳහා යොදවාගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) හඳුනා නොගත් රු.452,474 ක තැන්පතු සහ වසර 02 ක් ඉක්මවූ රු.363,329 ක රඳවාගැනීම් බදු මුදල් පියවා නොතිබුණි. | මෙහි ඇතුළත් "රඳවාගත් බදු" (WHT Tax) වටිනාකම 2011 වර්ෂයට අදාල වේ. මෙම මුදල් නිරවුල් කිරීමට අදාල විස්තර වවුචර් පත් පරීක්ෂා කර ලබාගත යුතු අතර එය සංකීර්ණ කාර්යයකි. නමුත් මෙම මුදල නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | තැන්පතු හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ වගකීමක් නොමැතිනම් ආදායමට ගැනීමට කටයුතු කළ යුතු අතර රඳවාගැනීම් බදු නිරවුල් කළ හැකිද යන්න පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) උඩවලව කාප් අභිජනන මධ්‍යස්ථානයේ ඉල්ලීමකින් තොරව ප්‍රධාන කාර්යාලය විසින් ලබා දී තිබූ ජලනල පද්ධති උපාංග වර්ග 4 ක්, විදුලි උපාංග වර්ග 5 ක් , යන්ත්‍ර සූත්‍ර අමතර කොටස් වර්ග 02 ක් සහ දැල් ආම්පන්න වර්ග 01 ක් 2019 ජුනි 20 දිනට සිදුකළ භෞතික පරීක්ෂාවේදී අතිරික්තව පැවතුණි. මීට අමතරව අතිරික්ත තොග තබා ගැනීම නිසා හෝමෝන වර්ග 5 ක් 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කල් ඉකුත් වී තිබුණි. | 2016 ජුලි 15 දින ජලනල පද්ධති උපාංග මිලදී ගෙන ඇති අතර ප්‍රතිපාදන ලැබෙන තෙක් තබා ඇත. 1991 ජනවාරි 29 අධිකාරිය ආරම්භ කිරීමට පෙර සිට විදුලි උපාංග, දැල් ආම්පන්න මිලදී ගෙන ඇත. මවු මසුන් වර්ධනය නොවීම හා ලබාගන්නා හෝමෝන වලට දක්වන ප්‍රතිචාරය අඩුවීම නිසා අතිරික්ත හෝමෝන ඉතිරි වී ඇත. | අවශ්‍යතාවය අනුව භාණ්ඩ මිලට ගැනීමට හා තොග පාලන ක්‍රමවේද අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උඩවලව කාප්, නව කාප් හා තිලාපියා අභිජනන මධ්‍යස්ථාන වල පවතින පොකුණු වර්ග ප්‍රමාණය 1000 $M^2$ක් වූ ටැංකි 7 ක උපරිම ධාරිතාවයෙන් යුතුව යොදාගෙන නොමැති බව 2019 ජූනි මස කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද මත්ස්‍ය නිෂ්පාදන සඳහා යොදාගෙන තිබුණු මත්ස්‍ය ප්‍රමාණයට සාපේක්ෂව ලබාගත් අස්වැන්න පොකුණු 08 කට අදාලව සියයට 3.5 සිට 13 දක්වා වූ අවම මට්ටමක පැවතුණි. 2018 මැයි මාසයේදී නව කාප් අභිජනන මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණද එහි පොකුණු 07 ක් භාවිතයට ගැනීම ප්‍රමාද වීම මාස 05 සිට මාස 11 දක්වා කාලයක් ගෙන තිබූ අතර තවත් පොකුණු 17 ක් අළුත්වැඩියා කර නොතිබීම හේතුවෙන්ද නිෂ්කාර්යව පැවතුණි. | 2019 වර්ෂයේ වෙන් වූ ප්‍රතිපාදන අනුව උඩවලව නව කාප් මධ්‍යස්ථානයේ පොකුණු 05 ක් ප්‍රතිශංස්කරණය කොට දැනට උපරිම ධාරිතාවයෙන් භාවිතා කරනු ලබන බව සඳහන් කරමි. ඉතිරි පොකුණු වල වූ අළුත් වැඩියා කිරිම් කටයුතු සඳහා මේවන විටත් "Tentative Estimate" පිළියෙල කොට ඇති බවත් අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අදාල පොකුණු පිලිසකර කිරිම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව දන්වනු කැමැත්තෙමි. තවද එම පොකුණු වල හයිඩ්රිල්ලා නැමැති ජලජ පැලෑටිය වර්ධනය වීම නිසා එය පාලනය කිරීම අවශ්‍ය වී ඇත. N1 පොකුණේ ජල කාන්දුව අධික වශයෙන් පැවතුණු අතර ඒවා පාලනය කළ නොහැකි ලෙස පාසි හා හයිඩ්‍රිල්ලා වර්ධනය වි ඇත. මේ නිසා ජල ප්ලවාංග (ස්වාභාවික ආහාර) පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. මේ නිසා අස්වැන්න අඩු වී ඇත. N4 පොකුණේ කැට්ලා වර්ගයට අයත් පසු කීටයන් තැන්පත් කර ඇති අතර මසුන්ට ලර්නියා නම් පරපෝශිතයා ආසාධනය වීම නිසා මසුන් මිය ගොස් ඇත. | මත්ස්‍ය ටැංකි උපරිම ධාරිතාවයෙන් යොදාගෙන තිබේද යන්න සොයා බැලීම හා වත්කම් නිසි ලෙස කළමනාකරණය කිරීම කළමනාකරණ මණ්ඩලයේ වගකීමක් වන අතර ඒ සඳහා අවශ්‍ය කළමනාකරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) | උඩවලව නව ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ජල සැපයුම් පද්ධතිය සපයා සවි කිරීමේ කර්මාන්තය සඳහා රු.8,628,689 ක් වැය කර 2018 පෙබරවාරි 11 දින වැඩ නිමකර තිබුණද විගණිත දිනය වූ 2019 ජූනි 19 දින වන විටත් පොම්පගාරය සඳහා විදුලිය ලබාගෙන නොතිබීම හේතුවෙන් රු.8,628,689 ක් වැයකර ඉදිකරන ලද ව්‍යාපෘතිය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කළ නොහැකි වී තිබුණි. | උක්ත කරුණ යටතේ උඩවලව නව ජලජීවි වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ජල සැපයුම් පද්ධතිය ඉදිකිරිමේ කර්මාන්තය යටතේ වූ පොම්පාගාරය සඳහා විදුලිය ලබා ගැනීමේ කටයුතු සඳහා අධිකාරියට අයත් වූ භූමිය තුල සිදු කල යුතු සියළු විදුලි රැහැන් ඇදිම හා පැනල් සවිකිරිම් නිම කොට ඇති බව දන්වනු කැමැත්තෙමි. තවද මෙම දින වලදි විදුලි බල මණ්ඩලය විසින් අදාල විදුලි බල සැපයුම ලබා දීමේ කටයුතු සිදුකර ගෙන යමින් පවති.එහි කටයුතු වල 95% පමණ භෞතික | ඉදිකිරීම් කොන්ත්‍රාත් සැලසුම් සහගතව නිමකළ යුතු අතර ධාරිතාවන් උපරිම අයුරින් උපයෝජනය කිරිමට කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | ප්‍රගතියක් අයත් කර ගෙන ඇති බව ද සඳහන් කරමි. ඒ අනුව නුදුරු දිනයකදි පොම්පාගාරය උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත.<br><br>එසේම විදුලි බල මණ්ඩලය හරහා පිටතින් ස්ථිර විදුලිය ලබා ගැනීමට කටයුතු කරන තෙක් තාවකාලික සැපයුමක් මඟින් ජලය පොම්ප කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව ද සඳහන් කරමි. | |
| (ඇ) තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ කම්කරු පියස ඉදිකිරීම සඳහා රු.14,063,040 ක් වැය කර කම්කරු නිවාස 05 කින් යුත් කම්කරු පියස ඉදිකර තිබුණ අතර 2019 ජුනි 19 දින වන විටත් ඉන් නිවාස 02 ක් නිෂ්කාර්යව පැවතුණි. | තිලාපියා අභිජනන මධ්‍යස්ථානයේ කම්කරු නිවාසයන්හි සිටි එක් අයෙක් මේ වනවිට මියගොස් ඇති අතර, අනෙක් පුද්ගලයා ස්ථාන මාරුවීමක් ලැබීම නිසා එයින් ඉවත් විය. ඒ හේතුවෙන් එම නිල නිවාසය පුරප්පාඩු වී ඇති අතර යම් නිලධාරියෙකු ඉල්ලීම් කල විට ලබාදීමට නියමිතය. | කම්කරු පියස උපරිම ධාරිතාවෙන් යුක්තව ප්‍රයෝජනය ගත යුතුය. මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මන්නාරම දිස්ත්‍රික්කයේ වෙඩිතලතිව් පිහිටි වනජීවී ප්‍රේරණ කලාපයට අයත් ඉඩමක වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගා නිෂ්පාදනය වැඩි කිරීම අරමුණු කරගෙන 2016 අගෝස්තු සිට 2018 අගෝස්තු දක්වා කාලය තුල ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර, සමාලෝචිත වර්ෂය වන විටත් පාරිසරික ඇගයීම් වාර්තා, ශක්‍යතා වාර්තා, අවධානම් තක්සේරු වාර්තා ලබාගෙන නොතිබූ අතරව්‍යාපෘතිය සඳහා ජලය හා විදුලිය ලබා ගැනීම සඳහා රු. 25,185,181ක් වැය කර තිබුණි. | මෙම ඉඩම නිරවුල් කරගැනීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව සමඟ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය දිගින් දිගටම සාකච්ඡා ගණනාවක් පැවැත්වූ අතර මේ පිළිබඳව 2020 මැයි 14 දි අරලියගහ මන්දිරයේ පැවති සාකච්ඡාවේදී මෙම ගැටලුව කඩිනමින් විසඳන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ශක්‍යතා වාර්තා, පාරිසරික ඇගයීම් වාර්තා, අවධානම් තක්සේරු වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඉරණමඩු අභිජනනාගාරය සඳහා ක්‍රමවත් ජල සැපයුමක් ලබා ගැනීම සයිපන් ව්‍යුහයන්හි අත්‍යවශය වැඩි දියුණු කිරීම් සඳහා පෞද්ගලික සමාගමකට 2018 ජුලි 25 දින රු.16,600,780 ක කොන්ත්‍රාත් මුදලකට ව්‍යාපෘතිය ලබා දී තිබුණි. 2018 ජුලි 25 සිට මාස 03 ක් තුල වැඩ නිම කිරීමට තිබූ මෙම කොන්ත්‍රාත්තුව වර්ෂයක් ඉක්මවා ගොස් තිබියදීත් වැඩ නිම වී නොතිබුණි. ඉහත ඉදිකිරීම පිළිබඳ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අංක NP/27/03/02/257 දරණ 2018 ඔක්තෝබර් 23 දිනැති ලිපිය අනුව, එකඟ වූ කොන්දේසි ඉක්මවා යමින් කළ පද්ධති එළීම හා ස්වාධීන ඇළ මාර්ග සඳහා කැණීම් කර තිබූ අතර මේ හේතුවෙන් 2018 ඔක්තෝබර් 23 සිට තාවකාලික වැඩ අත්හිටුවීමට ලක්ව තිබුණි. තවද වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සයිපන් ඉදිකිරීම් වලදී ජල ප්‍රවාහන පළල් කර තිබුණි. තවද කොන්ත්‍රාත්තුව යටතේ විචල්‍ය නියෝග මඟින් වැය කර තිබූ රු.368,081 ක් එම කාර්යයන් නවතා දැමීම හේතුවෙන් නිෂ්කාර්ය වියදමක් බවටද පත්ව තිබුණි. | ඉරණමඩු අභිජනනාගාරය සඳහා ක්‍රමවත් ජල සැපයුමක් ලබා ගැනීම සඳහා සයිපන් ව්‍යුහයන්හි අත්‍යවශ්‍ය වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය සඳහා වූ සැලසුම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි නැවත ව්‍යුහාත්මක සැලසුම් වෙනස් කිරිමට සිදු විය. මෙම ඉරණමඩු ජලාශය,වැවු බැම්ම හා ඒ අවට භූමිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වූ භූමියක් බැවින් සැලසුම් වල වූ වෙනස් කම් සෑම විටම ඔවුනගේ අවශ්‍යතාවය සපුරාලන පරිදි සිදුකල යුතුව තිබුණි.<br>තවද මෙම ව්‍යාපෘතියේ ජලාශය තුල වූ ඉදිකිරීම් කටයුතු අදාල ඉදිකිරීම් සීමාව දක්වා ජලය අඩු වූ පසු වියලි කාලයේදි කිරිමට සිදු විය. | ගිවිසුම් පරිදි කොන්ත්‍රාත් නිමකළ යුතු අතර සැලසුම් සහගතව ඉදිකිරීම් සිදුකල යුතුය. මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |
| (ආ) රුකව කකුළු වගා ව්‍යාපෘතිය 2018 ජුනි 11 ආරම්භ කර පොකුණු සකස් කිරීම හා අපවහන ජල සැපයුම් පද්ධති හා ටැංකි ඉදිකිරීම් වෙනුවෙන් රු.188,665,560 ක් වැය කර 2019 ජුනි වැඩ අවසන් කර තිබුණද මුදල් රෙගුලාසි 3 (ආ), III ප්‍රකාරව මූලික පිරිවැය රු.මිලියන 10 ට වැඩි ව්‍යාපෘති සඳහා මූලික අනුමැතිය එනම් අදාළ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ප්‍රතිපත්තිමය වශයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | මෙවැනි විශාල පිරිවැයක් සහිත ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම ඒ සඳහා සැලසුම් සකස් කළ යුතු අතර ශක්‍යතා අධ්‍යයන වාර්තා , පාරිසරික වාර්තා සහ අවධානම් තක්සේරු වාර්තා ලබාගත යුතු අතර ව්‍යාපෘති අතරමඟ නවතා දැමීමට සිදුවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ගෙන් කරුණු විමසා සිටිය යුතු |

| | | |
|---|---|---|
| නොතිබුණි. තවද උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන රකව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 42 ක භූමි ප්‍රදේශය හිමි පෞද්ගලික ඉඩම් හිමියන් සහ අධිකාරිය අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉඩම් ලබා දීම පිළිබඳ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. විගණන දිනය වන විටත් කකුළු වගාවට අවශ්‍ය ලවණතා මට්ටම නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘතිය අතරමග නවතා තිබුණි. | | අතර විකල්ප ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් කර සම්පත් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) පෞද්ගලික රාජ්‍ය හවුල් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට යෝජිත ගල්මුල්ල ක්‍රැබ්සිටි ව්‍යාපෘතිය සඳහා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර 89 ක් වූ රජය සතු භූමි ප්‍රමාණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් මඟින් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය හරහා අධිකාරිය වෙත වෙන් කර දී තිබුණි. කෙසේ වුවද 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනතේ වගන්ති අංක 30 (3) ප්‍රකාරව රජයේ කිසිම නිශ්චල දේපලක් රජයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව නොපැවරිය යුතු අතර පැවරීමකින් සිදු කරන්නේ නම් වගන්ති අංක 33 (1) අනුව යෝජිත පැවරීම ගැසට් පත්‍රයේ පල කර ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගෙන විධිමත්ව උක්ත ව්‍යාපෘතිය සඳහා පැවරීම සිදුකල යුතු වුවද අධිකාරිය වෙත වෙන්කර ඇති හෙක්ටයාර 89 ක භූමි ප්‍රමාණය සඳහා ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. උක්ත ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ රු. මිලියන 5 ක ප්‍රතිපාදන වෙන් වී තිබූ අතර මූලික පරිසර තත්ව වාර්තාව සහ අනෙකුත් සුළු වියදම් රු. 490,930 ක වියදම් දරා තිබුණි. 2018 නොවැම්බර් 03, රුපියල් මිලියන 80 ක වටිනාකමකට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ අතර ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන නොමැති වීම නිසා හම්බන්තොට | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ගල්මුල්ල ක්‍රැබ්සිටි ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම අයවැය ප්‍රතිපාදන තිබේද යන්න පරීක්ෂා කළ යුතු අතර මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු කර අවශ්‍ය ඉදිරි පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ගල්මුල්ල ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. | | |
| (ඇ) තිලාපියා සඳහා මත්ස්‍ය ආහාර ඒකකයක් උඩවලව කාප් අභිජනන මධ්‍යස්ථානයේ පිහිටුවීමට ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ගුණාත්මක තත්වයෙන් යුත් ආහාර අවම නිෂ්පාදන පිරිවැයක් දරමින් අධිකාරිය විසින් නිෂ්පාදනය කිරීමටත් වසරකදී අවම වශයෙන් මත්ස්‍ය ආහාර සඳහා දරනු ලබන වියදමෙන් රු.මිලියන 05 ක් පමණ ඉතිරිකර ගැනීමටත් සැලසුම්කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 අනුව, ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලෙස ඉල්ලීමක් කිරීමට පෙර ද ආරම්භක පාරිසරික පරීක්ෂණය, පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව, සමාජ බලපෑම් පිළිබඳ තක්සේරුව සහ ව්‍යාපෘතියට අදාළ වෙනත් සියලු ප්‍රසම්පාදනයට පෙර සූදානම් වීමේ කටයුතු සිදුකර නොතිබියදී රු.10,225,796 ක් 2019 වර්ෂයේදී මත්ස්‍ය ආහාර නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය සඳහා වැයකර තිබුණි. යන්ත්‍රය සවි කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල සූදානම් නොකිරීම, විදුලිබලය ලබා නොගැනීම, යටිතල පහසුකම් නොමැති වීම හේතු කොට ගෙන 2019 අගෝස්තු සිට 2020 අගෝස්තු දක්වාම යන්ත්‍රය ක්‍රියාත්මක තත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් මත්ස්‍ය ආහාර සඳහා සමාලෝචිත වර්ෂයේදීද රු. 57,791,585 ක් දැරීමට සිදු වී තිබුණි. තවද යන්ත්‍රයේ වගකීම් කාලය තුළ යන්ත්‍රය නිෂ්කාර්ය පැවති අතර රු.10,225,796 ක් වැය කරන ලද ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඒවා මනාලෙස සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීමක් වේ. නිෂ්කාර්ය වත්කම් පිළිබඳ සොයා බලා එම වත්කම් ඒවා කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීමේ වැඩ පිළිවෙල සකස් කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කලපු සංවර්ධන වැඩසටහන යටතේ රු.161,400,000 ක වටිනා වල් පැළෑටි සහ සුන්බුන් ඉවත් කිරීමේ යන්ත්‍ර 03 ක් මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.42,572,925 ක් 2018 ජුලි 13 දින ව්‍යාජ බැඳුම්කර ලියවිලි ඉදිරිපත් කරන ලද සැපයුම්කරුට අදාල ලියවිලි වල නිවරද්‍යතාවය තහවුරු කර නොගෙන ගෙවා තිබුණද එම නිළධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLUIII පරිච්ඡේදය අනුව කිසිඳු විනය ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි. මෙම අවිධිමත් ලෙස ගෙවූ රු.42,572,925 ක මුදල මාස 06 ක කාලයක් පෞද්ගලික පරිහරණයට ඉඩ හැර ආපසු අයකර තිබුණි. තවද නිළධාරීන් 04 දෙනෙකු මෙමෙ යන්ත්‍ර පරීක්ෂා කිරීම සඳහා විදේශ ගත වී තිබූ අතර ඒ සඳහා රු. 363,504 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබූ අතර මෙම මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාජ බැඳුම්කර සකස් කළ නිලධාරීන්ට හා සැපයුම්කරුවන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුයි. |